ජන සංගීතය

දයාරත්න රණතුංග

කථාව කියවීම කාව්‍ය ජනගීත හා ශාස්ත්‍රීය පදනමකින් යුත් ගීත කාලයත් සමග වර්ධනයවූ කොටස්ය. මේවා කොටස් දෙකකට වෙන්කළ හැකිය. මෙයින් එක් කොටසක් සංගීතවත් වන අතර අනිත් කොටස සංගීතවත් නොවේ. මෙයින් ඉහත සඳහන්කල කථාව හා කියවීම යන කොටස් සංගීතවත් ගනයට අයත් නොවේ. කවි ගායනය හා ගැමිගී ගායනය තරමක් දුරට සංගීතවත් වුවත් ඒවායේ සංගීතවත් ගතියට වඩා ඇත්තේ කාව්‍යමය ගතියකි. නර්තනය සඳහා උපයෝගී කරගත් ගීත සංගීතවත් මුහුණුවරක් ඉසිලිය. ඉන්පසුව ක්‍රමයෙන් ගීතශාස්ත්‍රීය අංගයන්ගෙන් සමන්විතව ශාස්ත්‍රීය ගීත බවට පරිවර්තනය විය.

අපි දැන් ඉහත සඳහන්කළ කොටස් එකිනෙක ගෙන කරුණු පරීක්ෂාකර බලමු. කථාව අපට ඉතා හොඳට පුරුදු දෙයකි. එහෙත් අප කථාකරනවිට අපේ මුඛයතුල ශබ්ද උපදින ආකාරය එය පිටත් වන ආකාරය සහ එම ශබ්දයන්ගේ උස්පහත් බව ගැන අප අතරින් කී දෙනෙක් පරීක්ෂාකාරීව සිතා බලා ඇත්ද? ළදරුවෙක් සිය මව්කුසින් බිහිවූ විගස හඬනගා හඬයි. කුඩා බිළිදා මෙසේ හඬන්නේ කළින් කිසිම පුහුණුවක් නොලබාය. ඔහු උපතලැබූ විගස සිය මුවෙන් සුරතල් සංගීත රාවයක් පිටකරයි. ක්‍රමයෙන් වැඩෙන ළදරුවා කථාකිරීමට පුරුදුවෙයි. මෙසේ අප දිව කථාවට ඉබේම පුහුණුවෙන අතර ඒ ගැන සොයාබැලීමට අපට උවමනාවක් වන්නේ නැත.

අප කථාකරන විටදී සහ කියවීමේදී සෑම මොහොතක් පාසාම සෑම අකුරක් පාසාම ශබ්දය උස් පහත් බැවින් වෙනස් වේ. අප වාක්‍යයක් කියවීමේදී තරමක් උස් හඬින් පටන්ගෙන අවසාන කිරීමේදී හඬ පහත් කෙරේ. ආමන්ත්‍රණය කිරීමේදී උස් හඬින් කථා කරනු ලැබේ. කරුණාවෙන් හෝ ආදරයෙන් යුතුව කථාකරන විට පහත් ස්වරයෙන් කථාකරනු ලැබේ. අප භාවිතය කරන සිංහල භාෂාවේ හල් ස යන්න (ස්) සහ වෙනත් හල් අකුරු ඇතැම්විට ඝෝෂා (Noise) ලෙස සැලකිය හැකි වුවත් අප කථාකරන වෙනත් අකුරු බොහෝ සෙයින් ස්වරයන් මතම පිහිටා ඇති බැව් පෙනේ. අප කථාකර විට දී හෝ යම්කිසි පාඨයක් කියවනවිට දී අප ශබ්දකරන වචන එකිනෙකට වෙනස්වූ ස්වරයන් මත පිහිටයි. සාහිත්‍යමය වචනවල නියම අර්ථය ගෙනදීමට නම් අකුරු එකිනෙකට වෙනස් ස්වර මත පිහිටුවීම අවශ්‍යය. අත්හදා බැලීමක් වශයෙන් වචන කිහිපයක් එකම ස්වරයක් මත පිහිටා කතා කලහොත් එය කෙතරම් අස්වාභාවිකදැයි පෙනී යනු

ඇත. අප කථාකරන විට ස්වභාවයෙන්ම ඇතිවන තවත් දෙයක් නම් රිද්මයයි. සමහරු ඉතා වේගයෙන් කතා කරති. සමහරු ඉතාසෙමින් කතා කරති. එක් එක් පුද්ගලයාට පෞද්ගලිකවූ රිද්මයක් ඇතිබව මෙයින් පැහැදිලිවේ. ඒකාකාර විශ්‍රාම සහිත හඬ උස් පහත් කරමින් රිද්මයානුකූලව කතා කරන විට එහි එක්තරා ලතාවක් ඇත. ඡන්දස් ක්‍රමය ඇතිවූයේ මෙයිනි. මෙම ඡන්දස් ක්‍රමයෙන් ගද්‍යය පද්‍යයට පරිවර්තනය විය. ඒ කාලයේ පැවති නාට්‍යවල භාෂාව ගද්‍යයටත් පද්‍යයටත් අතර ශෛලිගත ක්‍රමයක් අනුගමනය කලහ. මෙසේ සලකා බලනවිට පසුව ඇති වූ ගැමි සංගීතයත් ශාස්ත්‍රීය සංගීතයත් බිහිවීමට තුඩු දුන්නේ ඡන්දස් ක්‍රමය බැව් පෙනේ. එසේ හෙයින් පැරණිම සංගීත ක්‍රමය ඡන්දස් ක්‍රමය යැයි කිව හැකියි.

ජනසංගීතය පොදු වැසියාගේ සංගීතයයි. පොදු වැසියා ගීතයක් ගායනා කිරීමේදී විශ්‍රාම ආදිය කෙසේ යොද ගායනය කළයුතුදැයි නොදනී. ඔවුන් ගීතයක් ගායනය කිරීමේදී විශ්‍රාම ආදිය ඉබේම, ස්වභාවයෙන්ම ඇතිවේ. එහෙත් ජනසංගීතය ම්ලේච්ඡ මිනිසාගේ සංගීතයයැයි යමෙක් සිතුවොත් එය වැරදිය. ජන සංගීතය ජාතික සංස්කෘතිය සම්පූර්ණ කිරීමෙහිලා සැලකිය හැකි අත්‍යාවශ්‍ය අංගයකි. ශාස්ත්‍රීය සංගීතයේ පළමුවන පියවරද ජනසංගීතය යැයි සැලකිය හැකියි. ජන සංගීතයට නූගත් ගැමි ජනයා අතර ද උසස් තැනක් හිමි වේ. සෑම ජන ගීතයක්ම ශාස්ත්‍රීය සංගීතයේ එන නොයෙක් රාගරාගිනීන්ගේ ආභාසය ලබා ඇත. එසේ හෙයින් ඇතැම් ජනගීවල ඇති සමහර ස්වර සංගීතවල බොහෝ දුරට සමාන කමක් ඇතිවේ. එහෙත් පිළිගත් සිද්ධාන්ත මත ගොඩ නැගුනු ශාස්ත්‍රීය සංගීතයේත් ජන ව්‍යවහාර යෙන් ස්වභාවයෙන්ම ගොඩනැගුනු ජන සංගීතයේත් විශාල වෙනසක් ඇත. වර්ෂ 1935 භාරතයේ පූනා නගරයේදී ප්‍රසිද්ධ කරන ලද ''භාරතීය සංගීතය'' නැමැති සභරාවේ ජන සංගීතය ඇතිවූ සැටි දීර්ඝ වශයෙන් විස්තර කර ඇත. එහි සඳහන් වන පරිදි කතාව කියවීම යාග හෝම ආදියේදී හා දෙවියන් ඇදහීමේදී මන්ත්‍ර හා ස්තෝත්‍ර ගී වශයෙන් ක්‍රමයෙන් දියුණුව වන්දස් පිළිබඳව හැඟීමක් ඇතිව කාව්‍ය ගායනය ඇතිවිය. පසුව කාව්‍ය හා ජන ගීත ස්වදේශීය ගායකයන් විසින් ස්වභාවික අන්දමට ගායනය කිරීමට සලස්වා ඒවායේ ශබ්ද රසය ස්වර සහ වෙනත් කරුණු ක්‍රමානුකූලව මෙසේ විග්‍රහ කරනලදී.

1. ජනගීතයේ වෘත්තය නිතරම කාව්‍යමය වචන වල වන්දස්වලට අනුව සැදී ඇත.
2. තනුව ස්වතන්ත්‍රව ගායනය කෙරෙතත් ස්වර කිහිපයකට පමණක් සීමිතව එම ස්වර අතර පිහිටමින් පවතී.
3. ජන සංගීතයේ එන තනු ඉතා ලිහිල්වන අතර ඒවායේ යෙදෙන්නේ ස්වර ඉතාසුළු ගණනකි. ඒවායේ ඉතා කලාතුරකින් නොනැවතී සතර ස්වර සංඝාත දෙකක් පමණ එකවිටම යෙදේ.
4. මූලික වශයෙන් ජන සංගීතයේ ඒක ස්වර සංගීත (drone) යෙදෙන්නේ නැත. එහෙත් එක්තරා ස්වරයකට ප්‍රධාන ස්ථානය දී ගායනයේදී නිතරම එම ස්වරයම නැවත නැවතත් යෙදේ.
5. ජන සංගීතයේ යෙදෙන වැඩිම ස්වර ගණන නවයකි. ශුද්ධ ස්වර සප්තකය සමග කෝමල ගන්ධාරය හා කෝමලී නිෂාධය ද යෙදේ.
6. කෝමලී ස්වර ශුද්ධ ස්වර තරම් බහුලව යෙදෙන්නේ නැත.
7. සමහර විට දී සම ස්වරද (euharmonics) හටගනී. ආරෝහනයේදී උච්ච ස්වරය හට ගන්නා අතර අවරෝහනයේදී එහි මන්ද්‍ර ස්වරය හටගනී.
8. ආගම ඇදහීමේදී ගයනු ලබන දේව ස්තෝත්‍ර ආදිය තනිවම තමාටම ඇසෙනසේ ගයන විටදී එකම ස්වරයක් මත දිගටම ගායනවේ.
9. ඒවා ශබ්ද නගා ගායනා කිරීමේදී ඊට ලඟ ඇති තවත් එක් ස්වරයක් හෝ දෙකක් ගායනය වේ. ඒ ගායනය සම්පූර්ණ වශයෙන් ගත්කල එක් සතර ස්වර සංඝාතයකට වැඩි නොවේ.
10. විශාල සභාවක් ඉදිරියේ ගායනයේදී හෝ කියවීමේදී උච්චස්වරයකින් ආරම්භ කර පහත් ස්වරයකින් අවසන් කෙරේ.
11. දීර්ඝ වෘත්ත වලින් යුත් ගීත ගායනයේදී සතර සංඝාත දෙකක පමණ ස්වර එම ගී වලට ඇතුලත්වේ. දෙවන සංඝාතයෙහි ස්වර යෙදීම පළමු සංඝාතයෙහි ස්වර යෙදීමට අනුකූලවම වේ.
12. ජන ගීතයේ වචන අතර ඇතිවිය යුතු විශ්‍රාම ආදිය යෙදීම කලින් පුහුණුවීමක් නොමැතිව ම කළ හැක. එහි තනුව ඉතා ලෙහෙසියෙන් නිසි තැනට විශ්‍රාම යොද ස්වභාවයෙන්ම ගායනය කළ හැක.
13. පද්‍යය නිතරම පේළි ඉරට්ටේ ගණන කින් සමන්විතය. සෑම ඔත්තේ පේළියක් අවසානයේදීම තනුවෙහි අසම්පූර්ණ භාවයක් හැඟවේ. තනුවේ අසම්පූර්ණභාවය හැඟවෙන්නේ ඊළඟ ඇති පේළියේ අවසානයේදීය.
14. වඩාත් ක්‍රමානුකූල වෘත්තයේ එන ''ගන විරිතෙහි'' රිද්මය සැදී ඇත්තේ ගන නොං

හොත් නියමිත අක්ෂර සමූහයක් නියමිත ආකාරයකින් යෙදීමෙන්ය. වඩා ලිහිල් වෘත්ත යෙහි එන ''මාත්‍රා විරිතෙහි'' රිද්මය සැදී ඇත්තේ විටින් විට නහන විරාම වලිනි.

15. ගැමි ගීතය විග්‍රහ කර බලන විට පෙනියන කරුණු කිහිපයක් ඇත. ගැමි ගීතයට නියමිත වෘත්තයක් (metre) ඇත. එහි ගැබ් වී ඇත්තේ කලාත්මක රසයට වඩා විද්‍යාත්මක කරුණකි. වතුරට පැහැයක් නැත. වතුර අපට වුවමනා පැහැයක් ගැන්විය හැකිය. එසේම ගැමි ගීයෙහි රස භාවයද ගායකයාට අනුව වෙනස් වේ. එකම ගැමි වෘත්තය විරුද්ධ චරිත දෙකක් නිරූපණය කිරීමට යෙදෙවිය හැකිය.

පරීක්ෂාකාරීව බැලුවහොත් ගැමි ජනයා අතර පවතින ගැමි සංගීතයට වඩා දියුණු ජනතාව අතර පවතින ශාස්ත්‍රීය සංගීතය වඩාත් ක්‍රමානුකූල බව පෙනේ. ලෝකයේ එක් එක් සංගීතඥයාට පෞද්ගලික යැයි කිවහැකි සංගීත ශෛලි නිපදවිය හැක. එහෙත් මේ සෑම ශෛලියක්ම සංගීතයේ මූල ධර්ම කිහිපයක් මත රඳා පවතී. කෙතරම් නව නිර්මාණකලත් පුරාණ රාග රාගිනීන්ගෙන් බැහැරව යා නොහැකි බව වරක් තාගෝර් ගුරු දේවයාණෝ ප්‍රකාශ කළහ. සංගීතයේ ඇති ප්‍රධාන ශාස්ත්‍රීය කරුණු අවබෝධ කර ගතහොත් නව නිර්මාණ කිරීමේ හැකියාව ලැබේ. සංගීතය භාෂාවකි. එය තම හැඟීම් ප්‍රකාශ කිරීමේ භාෂාවයි. යම්කිසි භාෂාවක් හරි හැටි ඉගෙන නොගෙන එම භාෂාවෙන් කතා කිරීම කළ නොහැක්කකි.

අද ලෝකයේ මනුෂ්‍යයා දිනෙන් දින දියුණුව කරා ගමන් කරයි. සෑම විෂයයක්ම දිනෙන් දින දියුණුවේ. අපේ දියුණුවත් සමගම රස විඳීමේ ශක්තියත් දියුණුකර ගත යුතු ය. අද වැඩි දෙනෙක් පුරුදුවී සිටින්නේ පහත් රස විඳීමටය. මේ තත්වය ඉතා කණගාටුදායකය. මිනිසාගේ කල්පනා ශක්තිය උසස්වීමත් සමගම රස විඳීමේ ශක්තියත් උසස් විය යුතුය. උසස් කලා රසයක් විඳීමට හැකි තැනැත්තා හික්මුණු, ඉවසිලිවන්ත තැනැත්තෙකු විය යුතුය.

ජන ගීතයක් රස විඳීමේදී බොහෝ දෙනෙකු එහි තනුවට වඩා සාහිත්‍ය රසයම විඳින බව පෙනේ. සංගීතයෙහි ප්‍රධාන ස්ථානය ලැබිය යුත්තේ සාහිත්‍ය රසයට නොව ශබ්ද රසයටයි. සාහිත්‍යමය වචන නොමැති ජන ගීතයක තනුවක් පමණක් රස විඳීමට කී දෙනෙක් සමත් වේද? ශාස්ත්‍රීය සංගීතයෙහි එන ස්වර සංගති මීට වඩා ගැඹුරු භාවයක් උසුලයි. එය රස විඳීමට රස විඳීමේ ශක්තිය වඩා දියුණු කරගත යුතුයි. ඉහත සඳහන් කළා මෙන් එයට ඉවසීමද, හිත එක්තැන් කරගෙන වැඩි වේලාවක් සිටීමද අවශ්‍යය. මෙය පුහුණු කළ යුතුය. නියම සංගීතඥයාට පිටස්තර භාවනාවක් නොමැතිව ම සංගීතය නැමැති භාවනාවේ ආධාරයෙන් හිත එක්තැන් කිරීමේ හා හිත දියුණු කිරීමේ ශක්තිය ලැබේ.